සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අන්සාර් වරුන් විෂයයෙහි මෙසේ පැවසූහ. "දේවත්වය විශ්වාස කළ අයකු හැර වෙනත් කිසිවෙක් ඔවුනට ආදරය කරන්නේ නැත. කුහකයකු හැර වෙනත් කිසිවෙක් ඔවුන් සමග උරණ වන්නේ නැත. කවරෙකු ඔවුනට ආදරය කරන්නේ ද අල්ලාහ් ඔහුට ආදරය කරනු ඇත. කවරෙකු ඔවුන් සමග උරණ වන්නේ ද අල්ලාහ් ද ඔහු සමග උරණ වනු ඇත

අල් බරාඃ (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී: සැබැවින්ම නබි
(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අන්සාර් වරුන් විෂයයෙහි මෙසේ පැවසූහ.
"දේවත්වය විශ්වාස කළ අයකු හැර වෙනත් කිසිවෙක් ඔවුනට ආදරය කරන්නේ නැත. කුහකයකු හැර වෙනත් කිසිවෙක් ඔවුන් සමග උරණ වන්නේ නැත. කවරෙකු ඔවුනට ආදරය කරන්නේ ද අල්ලාහ් ඔහුට ආදරය කරනු ඇත. කවරෙකු ඔවුන් සමග උරණ වන්නේ ද අල්ලාහ් ද ඔහු සමග උරණ වනු ඇත."
[صحيح] [متفق عليه]

මදීනා වාසීන් වන අන්සාරිවරුන් කෙරෙහි ආදරය දැක්වීම දේව විශ්වාසයේ පූර්ණත්වය සඳහා වන ලක්ෂණයකි යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. එය ඉස්ලාමයටත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ටත් උපකාර කිරීමේ දී ඔවුන් පෙරටුගාමීන් වූ බැවින් හා මුස්ලිම්වරුන්ට පිහිට වීමට වෙර දැරීම හා අල්ලාහ් වෙනුවෙන් තම මුදල් හා ජීවිත ඔවුන් වෙනුවෙන් ලබා දුන් බැවිනි. ඔවුන්ට වෛර කිරීම කුහකකමේ සලකුණකි. පසුව කවරෙකු අන්සාර් වරුන්ට ප්රිය කළේ ද අල්ලාහ් ඔහු ප්රිය කරන බවත් කවරෙකු ඔවුන් සමග කෝප වූයේ ද අල්ලාහ් ද ඔහු සමග කෝප වන බවත් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් පැහැදිළි කළහ.

https://sunnah.global/hadeeth/si/show/3438